# සහජාත කුඩා ගණය ශුද්ධ සඞ්ඛ්‍යා

**1. හෙතු** (ප්‍රත්‍යයාගේ ශුද්ධසඞ්ඛ්‍යා වාරයේ) සම්ප්‍රයුක්ත ස්කන්ධ, සහේතුක චිත්තජ රූප, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍ය වන්නා වූ හේතු සය (යන මෙම ධර්මයෝ හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වන්නා වූ ධර්මයෝ වෙත්.) සඞ්ඛ්‍යා සතකි. සුදුසු පරිදි එක්වර ප්‍රත්‍යය වන්නා වූ සහජාත මහා මධ්‍යම ප්‍රත්‍යයන් සහ අධිපති, ඉන්ද්‍රිය, මග්ග යැයි ප්‍රත්‍ය මුළු ගණන දොළොසකි.

**2. සහජාතාධිපති** (ප්‍රත්‍යයාගේ ශුද්ධසඞ්ඛ්‍යා වාරයේ) සම්ප්‍රයුක්ත ස්කන්ධ, සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍ය වන්නා වූ අධිපති ධර්මයන් තුන සතර අතරින් එක එකක් (යන මෙම ධර්මයෝ සහජාතාධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වන්නා වූ ධර්මයෝ වෙත්.) සඞ්ඛ්‍යා සතකි. සුදුසු පරිදි එක්වර ප්‍රත්‍යය වන්නා වූ සහජාත මහා මධ්‍යම ප්‍රත්‍යයන් සහ හෙතු, ආහාර, ඉන්ද්‍රිය, මග්ග යැයි මුළු ප්‍රත්‍ය ගණන දහතුනකි.

**3. සහජාතකම්ම** - සම්ප්‍රයුක්ත ස්කන්ධ, චිත්තජ රූප, ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන්නා වූ සිත් එකුන් අනූවෙහි ඇති චේතනා. සඞ්ඛ්‍යා සතකි. සුදුසු-පෙ-ආහාර යැයි මුළු ප්‍රත්‍ය ගණන දසයකි.

**4. නාමාහාර** - සම්ප්‍රයුක්ත ස්කන්ධ, චිත්තජ රූප, ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍ය වන්නා වූ ඵස්ස, චෙතනා, විඤ්ඤාණ යන නාමාහාර ධර්මයන් තුන. සඞ්ඛ්‍යා සතකි. සුදුසු-පෙ- අධිපති, කම්ම, ඉන්ද්‍රිය යැයි මුළු ප්‍රත්‍ය ගණන දෙළොසකි.

**5. සහජාතින්ද්‍රිය** - සම්ප්‍රයුක්ත ස්කන්ධ, චිත්තජ රූප, ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍ය වන්නා වූ ජීවිතින්ද්‍රිය, චිත්ත, වෙදනා, සද්ධා, වීරිය, සති, එකග්ගතා, පඤ්ඤා යන නාම ඉන්ද්‍රිය පරමාර්ථ ධර්මයන් අට. සඞ්ඛ්‍යා සතකි. සුදුසු-පෙ- හෙතු, අධිපති, ආහාර, ඣාන, මග්ග යැයි මුළු ප්‍රත්‍ය ගණන දහහතරකි.

**6. ඣාන** - සම්ප්‍රයුක්ත ස්කන්ධ, චිත්තජ රූප, ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍ය වන්නා වූ විතර්ක, විචාර, පීති, වෙදනා, එකග්ගතා යන ධ්‍යානංග පස. සඞ්ඛ්‍යා සතකි. සුදුසු-පෙ- ඉන්ද්‍රිය, මග්ග යැයි මුළු ප්‍රත්‍ය ගණන එකොළොසකි.

**7. මග්ග** - සම්ප්‍රයුක්ත ස්කන්ධ, සහේතුක චිත්තජ රූප, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍ය වන්නා වූ පඤ්ඤා, විතර්ක,

ශුද්ධ සඞ්ඛ්‍යා - 01
විරතිත්‍රය, වීරිය, සති, එකග්ගතා, දිට්ඨි යන මාර්ගාංග නවය. සඞ්ඛ්‍යා සතකි. සුදුසු-පෙ- හෙතු, අධිපති, ඉන්ද්‍රිය, ඣාන යැයි මුළු ප්‍රත්‍ය ගණන දහතුනකි.

## <u>සහජාත මහා ගණය ශුද්ධසඞ්ඛ්‍යා</u>

**සහජාත, සහජාතනිස්සය, සහජාතඅත්ථි, සහජාතඅවිගත** ප්‍රත්‍යයන්ගේ ශුද්ධසඞ්ඛ්‍යා වාරයේ-

1. ඔවුනොවුන්ට ද; ඔවුනොවුන් නාමස්කන්ධයන්ට ද, චිත්තජ රූපයන්ට ද, ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන්නා වූ සියළු ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ සතර දෙන ද

2. ඔවුනොවුන්ට ද; උපාදරූපයන්ට ද ප්‍රත්‍යය වන්නා වූ මහාභූතයෝ සතර දෙන ද

3. ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන්නා වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ සහ හදය වස්තුව ද

යන මෙම ධර්මයෝ සහජාතනිස්සය, සහජාතඅත්ථි, සහජාතඅවිගත යන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නා වූ ධර්මයෝ වෙත්. සඞ්ඛ්‍යා නවයකි. ප්‍රත්‍යයෝ සතරකි. (ප්‍රත්‍යයෝ සතර නම් සහජාත, නිස්සය, අත්ථි, අවිගත යි.)

## <u>සහජාත මධ්‍යම ගණය ශුද්ධසඞ්ඛ්‍යා</u>

**අඤ්ඤමඤ්ඤ** ප්‍රත්‍යයේ ශුද්ධසඞ්ඛ්‍යා වාරයේ-

1. ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන්නා වූ සියළු ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ සතර දෙන ද

2. ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන්නා වූ චිත්තජ, ප්‍රතිසන්ධි කර්මජ, බාහිර, ආහාරජ, උතුජ, අසඤ්ඤසත්ව කර්මජ, ප්‍රවෘත්ති කර්මජ වශයෙන් මහාභූතයෝ සතර දෙන

3. ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන්නා වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ සහ හදය වස්තුව ද

ශුද්ධ සඞ්ඛ්‍යා - 01
යන මෙම ධර්මයෝ අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නා වූ ධර්මයෝ වෙත්. සඞ්ඛ්‍යා තුනකි. සහජාත මහා සතර, අඤ්ඤමඤ්ඤ සමඟ ප්‍රත්‍යයෝ පසකි.

**විපාක** ප්‍රත්‍යයේ ශුද්ධසඞ්ඛ්‍යා වාරයේ-

1. ඔවුනොවුන්ට ද; ඔවුනොවුන් නාමස්කන්ධයන්ට ද, චිත්තජ රූපයන්ට ද, ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන්නා වූ සියළු විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ සතර දෙන ද

2. හදය වස්තුවට ප්‍රත්‍යය වන්නා වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ද

යන මෙම ධර්මයෝ විපාක ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නා වූ ධර්මයෝ වෙත්. සඞ්ඛ්‍යා එකකි. සහජාත මහා සතර සහ විපාක සමඟ ප්‍රත්‍යයෝ පසකි.

**සම්ප්‍රයුක්ත** ප්‍රත්‍යයේ ශුද්ධසඞ්ඛ්‍යා වාරයේ- ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන්නා වූ සියළු ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ සතරදෙන යන මෙම ධර්මයෝ සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නා වූ ධර්මයෝ වෙත්. සඞ්ඛ්‍යා තුනකි. සහජාත මහා සතර, අඤ්ඤමඤ්ඤ, සම්ප්‍රයුක්ත සමඟ ප්‍රත්‍යයෝ සයකි.

**විප්‍රයුක්ත** ප්‍රත්‍යයේ ශුද්ධසඞ්ඛ්‍යා වාරයේ-

1. චිත්තජ රූප, ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන්නා වූ පඤ්චවෝකාර භවයෙහි පහළ වන අවස්ථාවේදී අරූප විපාක සතර දෙන, ද්විපඤ්ච විඤ්ඤාණ, රහතන්වහන්සේගේ චුති සිත හැර ප්‍රවෘත්ති, ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ සතර දෙන ද

2. ඔවුනොවන්ට ප්‍රත්‍යය වන්නා වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ, හදය වස්තුව ද

යන මෙම ධර්මයෝ විප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නා වූ ධර්මයෝ වෙත්. සඞ්ඛ්‍යා තුනකි. සහජාත මහා සතර සහ විප්‍රයුක්ත සමඟ ප්‍රත්‍යයෝ පසකි.